# පරිසරය සම්බන්ධ අපේ සිරිත් විරිත්

**අපේ සංස්කෘතිය පරිසරය හා බැඳී පැවතුනක් විය. මෙනිසා පරිසරය හා සහජීවනයෙන් විසීමට අපේ පැරැන්නෝ පුරුදු වූහ. තමා අවට ඇති ගස්, වැල්, සතුන් ආදී සියල්ලම ඔවුන්ගේ නොමඳ ආදරයටත්, ආරක්ෂාවටත් ලක්විය. තාක්ෂණික ලෝකයක වෙසෙන අද මිනිසාටද ප්‍රයෝජනවත් එම අත්දැකීම් පිළිබඳව ලියවුන ලිපියකි මේ.**

අධි වේගයෙන් අභාවයට යන, ඇතැම් විටක පරණ හණමිටි ලෙසින් නූතනයන්ගේ අවඥාවට හා පාච්චලයටද ලක්වන, පාරම්පරික සිංහල ගැමි සිරිත් තුලනාත්මකව හැදෑරීමේදී, සත්ත්ව කරුණාව, තුරුලිය බැතිය හා මානව දයාව ද ප්‍රමුඛව ගොඩ නැගුණු පරිසරවේදීත්වය, දේශීය සංස්කෘතියේ පරිනාමයට අනිවාර්ය පදනමක් වූ බව පසක් වේ. 'සතා සරුපයාට' මෙන්ම 'වනේ වන හතුරාට' පවා දයාවෙන් සමාව දීමට තරම් පෘථුල අධ්‍යාත්මික සුපරිතාවකින් ආඪ්‍ය ජාතියක් බවට සිංහලයාගේ සංස්කෘතිය උදව් වූයේ බුදු දහමේ ප්‍රචලිත පරිසර දයාව ඔස්සේ බව යථාර්තාවාදීව විමසන්නෙකුට වැටහිය යුතු සත්‍යයයි. සිංහල ගැමි සිරිත් විරිත් වලින් හෙළිවන පරිසර වේදීත්වය මනාව විශ්ලේෂණය කිරීමෙන් උක්ත ප්‍රමාදයේ යථාර්ථවාදීත්වය අවබෝධ කර ගැනීම අපහසු නොවේ.

සිංහලයාගේ පාරම්පරික පිළිවෙත වූයේ' 'බඩගින්න බලා බත් දීම' මිස සාගතයකු අහර පතක් ඉල්ලන තෙක් නිහඬව සිටීම නොවේ. එයින් හැඟෙන්නේ ඔහු පරිසරය නොහොත් වටපිටාව අරබයා අවදි වූ අවදනයකින් පසු වූ බව නොවේද? 'බඩගිනිද' යි ඇසුවොත්, 'එසේය' යි පිළිතුරු දීමට හත් වේලක් නිරාහාර වූවකු වූවත් පැකිළෙනු නිසැක බව පුහුදුන් මිනිසාගේ අභිමානය ගැන දන්නෝ දනිති. බඩගිනි හඳුනා, බත් දීම අත්‍යාවශ්‍ය, එහෙයිනි. ඒ සඳහා වටපිටාව පිළිබඳ අවධානයට අමතරව දයාව ද අත්‍යාවශ්‍යය. සිංහල ගැමියාගේ දයාව මානවයන්ට පමණක් සීමා නොවූ බව, ඔහු ප්‍රදර්ශනය කළ සිතින්ම පමණක් කරුණාවෙන් ප්‍රකට වෙයි. පරිසර වේදිත්වයේ පදනම සත්ත්ව කරුණාව නොවේද?


මහාචාර්ය

**අලවත්තාගොඩ පේමදස විසිනි.**

## ජීවන මූලාර්ථය

දඬාවතේ යන බල්ලකු වූවත් කෑමක් කන විටක පහර දීමට නොව එළවා දැමීමට වත් පෙළඹෙන්නේ කලාතුරකින් ගැමියකු පමණි. 'කන විට කිසි සතකුට ගහන්න එපායි' අප කුඩා කල දෙගුරුන් අවවාද කළ බව මට මතකය. ඒ ඇයි? කවර සතකුගේ වූවද ජීවත් වීමටයි පර්යායවන තරමටම, එය උත්තරීතර සංසිද්ධියකි. ආහාර ගන්නා විට සතකුට වත් කරදර නොකිරීමත් හෙළිවන්නේ සිංහලයා මේ ජීවන මූලාර්ථය මැනවින් වටහා ගත් බව නොවේද?

ගැබ්බර බැල්ල, බැළලිය බඳු කිසිදු සතකුට ශාරීරික පීඩා නොකිරීමට පමණක් නොව ආහාර පානාදියෙන් සැලකීමට ද සිංහල ගැමියා නිබඳවම පෙළඹුනේ, සත්ත්ව කරුණාවටත් වඩා මාතෘත්වයට ගරු කිරීමේ පිළිවෙත නිසා නොවේද? ගැබ්බර වූ විට මානව ළඳ හා තිරිසන් ළඳ අතර ඇත්තේ කුමන වෙනසක් ද? දඩයමින් බඩ වියත රැක ගන්නා ම්ලේච්ඡයකු ලෙස සැලකෙන ගැමියා පවා පැටවා බඩ බැඳි වැඳිරිය හෝ ගැබ්බර වල් සතකු හෝ නොමැරීමට තරම් පාරිසරික දයාවන්තයකු වූයේ ඇයි.



**පරිසරය රැකීම අපේ සම්ප්‍රදාය විය.**

දඩයම ජීවනෝපාය බව සැබවි. ඔහු අන් කමක් නොදනී. එහෙත් දඩයම ජීවනෝපාය වුවත් මාතෘත්වයට, දරු සෙනෙහසට අවකනකු වීමට තරම් ඔහු සංහාරකයකු නො විය.

දැලකින් වරකට මසුන් දෙතුන් සියයක් ගොඩ දා මරණ මස් මරන්නා වුවද ආහාරයට ගත නොහැකි මසකු වූ ''පේත්තයා'' යලිත් දියට දමන්නේ ඇයි? පරිසරවේදී සත්ත්ව කරුණාව නිසා නො වේද? මසුන් මරණ ඔහුගේ සිත සත්ත්ව කරුණාවෙන් උණු වන්නේ ඇයි? ජීවත් වීම සඳහා මසුන් ඇල්ලීම අනිවාර්යය. ඔහු එය කරන්නේ පවක්, බව නොදන්න නොවේ. විකල්පයක් නැති බැවිනි. එහෙත් පලක් නැති 'පේත්තයා' නිරපරාදේ මැරීමට තරම් ඔහු ම්ලේච්ඡ යකු නොවේ. මසුන් මැරීම ජීවනෝපාය වුවත්, පරිසරවේදී ජීවන දහමක් විසින් ඔහු ගේ ජීවිතය සැකසී ඇති බැවිනි.

අපේ ගැමියාගේ මේ හුදු පරිසර වේදිත්වය, මාර්ටින් වික්‍රමසිංහ හුවා දැක්වූ යේ මෙසේ යි.

''ගඟ මැද දී මගේ කුඩා බෑනකුගේ කබායෙ අත ඔස්සේ දිමියෙක් ඇදෙන්නට වූයේය. දිමියා තමාගේ බෙල්ල තෙක් ඇවිත් තමා කතී යි බිය වූ හෙතෙම කටින් පිඹ ඌ ගඟෙහි දැමීය.

අපොයි, කියමින් කිරිබබා වමතින් හිස බඳ ගත්තේය.

''ඇයි කිරිබබා'' යි එහි සිටි මගේ බෑනාගේ පියා ඇසීය.

'' එහෙම කරන්න එපා, පොඩි මහත්තයා, බොහෝම පව්'' යි කිරිබබා කුඩා දරුවාට අනුශාසනා කළේය.''

'එක වරක් දැල හෙලීමෙන් ඇතැම් විට, මසුන් දෙතුන් සියය, ගොඩ ලා මරණ කිරිබබා, කුඩා දරුවකු දිමියකු දියෙහි දමනු දැක හිස බඳ ගත්තේ කුහක කමින් නොවේ. ඔහු කුහකකම් නො දන්නා අවංකයකු වුවද පුරුද්ද නිසා ඔහුට මසුන් මැරීමේ වරද නොහැහෙයි.



පරිසරය වෙනස් වන ආකාරය

එක වර මසුන් සිය ගණනක් ගොඩ දැමීමෙන් මරන නමුදු, ඔහුට කුහුඹුවකු මැරීම පවා දැරිය නොහැකිය. ඔහු කුහුඹුවකු මැරීම පවක් මෙන් සලකන්නේ කුහක කමින් නොවේ. එය ඔහුගේ අවංක හැඟීමද වැටහීම ද බව පහත දැක්වෙන පුවතකින් හෙළි වෙයි.

( අපේ ගම. පිට 62)

''අනතුරුව වික්‍රමසිංහ ඒ පුවත විස්තර කරයි. ගෙදරට කරදරයක් වූ මීයකු උගුලක් අටවා අල්ලා ගත් බිරිඳ, ඌ ගඟෙන් එගොඩට ගෙන ගොස් දමන්නැයි කී විට කිරිබබා එය ප්‍රතික්ෂේප කළේ මේ වදනිනි.

''අනේ මට බෑ, ගොඩ සතකුට හිංසා වක් කරන එක දරුවකුට හිංසාවක් කරනවාටත් වඩා අමාරු වැඩක්''.

කිරිබබා සැබවින්ම ප්‍රකට කළේ අකපට සිංහල ගැමියා ගේ පරිසරවේදී සත්ත්ව කරුණාවයි. පුරුද්දට මසුන් ඇල්ලුවද, බුදුනු හැදියාවකින් පෝෂිත වූ සිංහල ගැමියා සැබෑ පරිසර හිත කාමියකු වූ බව කිරිබාබා බඳු අහිංසකයෝ හෙළි කරති. එමතුද නොවේ. මසුන් මරන්නා ගේ නිවසින් පවා ගමේ පන්සල ට මසකට වරක් සලාක දනක් ලැබේ. එයින් හෙළි වන්නේ කුමක්ද ? 'ප්‍රාණඝාතය' ජීවනෝපාය වුවද බුදුදහම ජීවන මඟ වූ බව නොවේද? මේ සත්‍යය වඩාත් ප්‍රකට වන්නේ පුන් පෝද හා අමාවක්ද මසුන් මැරීමෙන් වැළකීමට තරම් මසුන් මරන ගැමියා දයාවන්ත පරිසරවේදියකු වී මෙනි.

### පරිසර දයාව

පෝද නිවාඩුව පැවති සමයේ සුරා බොමින් මස් කමින් බමන සුවයෙන් ගත කිරීමට තරම් සිල්වත් වූ මෑත අතීත යේ සිංහල සුචරිතවාදීන්ට ගැමි මසුන් මරන්නාගෙන් වදින්නේ කදිම සංස් කෘතික හා පරිසර වේදී අතුල් පහරක් නොවේද? අද පවා ඇතැම් ධීවරයෝ පෝද මසුන් මැරීම වරන බව මා අසා තිබේ. එතැන රජයන්නේ සැබෑ පරිසර දයාවක් නොවේද?

සතුන් මරා මස් කෑම මිනිසා ප්‍රමුඛ හැම මාංශභක්ෂකයකු ගේම පැවැත්මේ පදනමයි. රේමන්ඩ් ලින්ඩමාන් විසින් 1942 දී ප්‍රකාශිත පුරෝගාමී පෝෂක

ගතික නියාමය (Trophic dynomic axiom) අනුව ජීවීන් ගේ පැවැත්ම හා පරිසර පද්ධතියක ගතිකතුලනයද සඳහා මාංශ භක්ෂසය අනිවාර්යය. උදහරණයක් වශයෙන් සියලුම සතුන් ශාක භක්ෂක යන් වූවොත් පරිසර පද්ධතියක් වැඩි කලක් නොපවතී. අධි භක්ෂණය නිසා සියලු ශාක වැනසෙන අතර මාංශ භක්ෂකයන් තොරවීම නිසා පාලනයකින් තොරව අසීමිතව වැඩිම නිසා ශාක භක්ෂකයන් ගේ ජනගහනය වැඩිවීමෙන් ස්වයං ව්‍යසනයකට මග පැදෙනු නිසැකය. එවන් ප්‍රවණතාවක අවසානය සමස්ත පරිසර ගෝලය ම විනාශ වීමයි. දියදම් දීනිතිය ගේ අඛණ්ඩ පැවැත්මට මාංශ භක්ෂණය අනිවාර්යය. දඩයක්කාරයා හා මසුන් මරන්නා පරිසර තුලනයට අනිවාර්ය බවට තර්ක කළ යුත්තේ එහෙයිනි.

එහෙත් ප්‍රාණ ඝාතය මුල්ම පවක් ලෙස සලකන බුදුනු සිංහල ගැමියා මසුන් මැරීමෙන් ජීවත් වන්නේ පරිසර දයාව හා සත්ත්ව කරුණාව රහිත වූවකු නිසා නොවේ. පෝද මසුන් නොමැරීම, අනවශ්‍ය සතුන් නොමැරීම අනවශ්‍ය ලෙස සතුන්ට හිරිහැර නොකිරීම බඳු ඔවුන්ගේ ගති හෙළි කරන්නේ උත්තරී-තර පරිසර දයාව ප්‍රමුඛ සත්ව කරුණාවයි.

ශිෂ්ඨ මිනිසකු ලෙස සංවිධානය වූ ජීවිතයක් ගතකළ නමුදු පාරම්පරික සිංහලයා ජීවත් වූයේ පරිසරයේම අනිවාර්ය සහජීවක සංඝටකයක් වශ යෙන් බව ඔහුගේ සත්ත්ව කරුණාවට අමතරව වෙනත් විවිධ වත් පිළිවෙත් වලින් හෙළි වෙයි.


### හෙයියන් මාරුව

කිරි දෙවීමට දෙනගේ බුරුල්ල සේදීම ටත් පළමු ගැමියා කළේ කුමක්ද? දූත ඔසවා කිරි දෙනට නමස්කාර කිරීමයි. එයින් හෙළි වන්නේ සිය සුරබිදෙනට ගරු සැලකිල්ලක් දැක්වීම පමණක් නොවේ. අහිංසක පැටියා හාමතේ තැබීමෙන් සිදු වන නිර්දය අකරුණාවට සමාව පැතීමක්ද ඉන් සංකේතවත් වේ. ඒ මගින් පැහැදිලි වන්නේ සත්ත්ව දයාව හා පරිසර දයාව නොවේද?

කරත්තේ බැඳීමට පෙර දැත එක් කොට ගොනාට නමස්කාර කිරීම, කරත්තකරු ගේත්, සී සෑමට නඟුලේ බඳින්නට පෙර ගොනාට වැඳීම සීසාන්නා ගේත්, මැඩවීම ඇරඹීමට පෙර මී හරකුන් ට වැඳීම එඬේරාගේත් බර අද්දවන්නට පෙර අලියාට වැඳීම ඇත් ගොව්වාගේත් පිළිවෙතයි. සිය බඩ වියත රැක ගැනීමට ඒ තිරිසනුන් කරන මෙහෙවරට කෘතඥ හා කෘතවේදී වීමට අමතරව, හෑමේ, මැඩවීමේ, ගැල ඇදීමේ යනාදියේ දී කෝටු පහරින් ගෙරියාට සිදු වන ශාරිරික පීඩනය වෙනුවෙන් සමාව අයැදීමක්ද උක්ත පිළිවෙතින් ඉටු නොවේද? සිය කටයුතු සඳහා ජව බලය යොදා ගැනීමේදී ගෙරියාට පහර දීම අනිවාර්ය වූවත්, ගැමියා එසේ කළේ නිර්දයව නොවේ. ඒ තිරිසනා පෙළා තෘප්තිමත් වීමට නොවේ. එහෙත් එවන් ශාරීරික පීඩනයකින් ගෙරියාට සිදු වන මානසික පීඩනය හොඳින් දත් බව 'යමන් පුතා' යි උගේ පිට අත ගෑමෙන් හෙළි වෙයි.

සීසෑමේදී නගුල අදින හෙයියා නො හොත් ගොනා විඩාවට පත්වූ විට තව දුරටත් උගෙන් වැඩ ගැනීම ගොවියාගේ සිරිත නොවේ. නූතනයේ ඇතැම් කරත්තකරුවන් මෙන් අසරණ තිරිසනා විඩාවෙන් ලගිද්දීත්, වලිගය නවමින්, අන්ඩකෝෂය මිරිකමින් , කෝටු පහර දීම පාරම්පරික සිංහල සිරිත නොවීය. සීසෑමේදී හෙයියන්මාරු කරන ලද්දේ එහෙයිනි. කුමාරතුංග මුනිදස 'ප්‍රබන්ධ

කම්මරුවන් හා ගොවියන් ප්‍රමුඛ විවිධ ශ්‍රමිකයෝද පුන් පෝද හා අමාවක ද කැත්තේ උදල්ලේ වැඩ නොකිරීම පාරම් පරික වතක් ලෙස පිළිපදිති. මසකට දෙදිනක් ඔවුන් වැඩ වරන්නේ විවේකයක් අවශ්‍ය නිසාම නොවේ. විශේෂයෙන්ම උදැල්ල භාවිතයේ දී සතුන් කැපී කෙටී යාම වරදක් ලෙස සැලකීමට තරම් බුදුනු සංස්කෘතියෙන් පෝෂිත සත්ත්ව හිතවාදිත්වයක් ඔවුන් තුළ මුල් බැසී බැවිනි. එසේ නම් අන් දිනවල සතුන් නොමැරෙත්ද, එය අකුසලයක් නොවේ දැයි දැන් කෙනෙකු තර්ක කරන්නටද බැරි නැත. එවන් අන්තවාදී ආකල්ප වලට ගැති වූවත් යථාර්ථවාදී කිරීම අසීරු කරුණකි. මිනිසා වෑයම් කළ යුත්තේ පරිසරය මත අවම පීඩනයක් ජනිත කරමින් ජීවත් වීමට යි. මේ සත්‍යය ගැමි සිංහලයා ගේ සංස්කෘති යෙන් හෙළි වන බව පෝද වැඩ වැරීමෙන් පමණක් වුව ප්‍රකට නොවේද?



පරිසරය සුරැකීම සංස්කෘතික අංගයක් විය.

සංග්‍රහයේ' පළ කළ 'නගුල' නමැති පබැඳුමේ මේ විස්තරය විමසනු මැනවි.

''නගුල අඳනා හෙයියෝ වහා විඩාවට පැමිණෙති. සීසෑම පුරා දවසක් කරත හොත් කිහිප වරක් මැ හෙයියන් මාරු කරන්නට වෙයි. ගොවියාට මේ ඉතා බර කාරියෙකි. කුඹුරින් නගුල ගොඩට අද්ද, බැඳී හෙයියන් මුදා, වෙන හෙයියන් දෙදෙනකු යොදා, යළි දු නගුල මඩට ඇද්දීම ගොවියාට රිසියෙන පමණට වඩා කාලයෙක් ද ගෙවෙන්නේය. වෙන කවර බර කටයුත්තක් වුවද සිතට නැගෙන්නේ මේ හෙයියන් මාරුවයි. බර, කල් යන කටයුත්තකට 'හෙයියම් මාරුව' යැයි ඔහුගේ මුවින් කියැවෙන්න ට වන්නේ මෙසේ යැ.'' (පිට 139)

කොතරම් හාරදුර වුවද විඩාපත් ගෙරියා ගෙන් තවදුරටත් තල තලා වැඩ ගැනීමට ගොවියා නොසිතුවේ එය අකාර්යක්ෂම නිසා මෙන්ම සත්ත්ව කරුණාව ද නිසාය. දවසේ කටයුතු නිමවීමෙන් පසු ගෙරියන් ට දරුවන්ට මෙන් සැලකීමෙන්ද මේ දයාව තවත් ප්‍රකට වෙයි. අවුරුදු නැකතට තණ හා දියෙන් සංග්‍රහ කිරීම හා හිස තෙල් ගාන නැකතට නානු හා තෙල් හිසේ ගෑම යනාදිය ගැමියා තුළ ගෙරියාට පැවති දයාවේ මහිමය හුවා දක්වයි.

එමතුද නොවේ. සීසෑමෙන් විඩා වූ ගවයන්ට උලාකෑමට හා හෙවණේ සැත සීමට කුඹුරු යායේ අවට වනයත් සුරැකීමට ගැමියන් පෙළඹුනේ පරිසර වේදිත්වය හුවා දක්වමිනි. ඒ බව සිය ප්‍රබන්ධ සංග්‍රහයේ පළමු කුඹුර නැමැති පබැඳුමේ කුමාරතුංගයන් සඳහන් කළේ මෙසේයි.

### බුද්ධ භෝග

''යායට දෙපසැ මැ හෝ එක් පසෙකැ හෝ වන බිමක් වුවමනා ය. කුඹුරේ වැට කඩුලු බැඳීමට ඉනි රිටි ආදිය ද හෙයියනට අවුළා කන අහරද සපයන්නේ මේ බිමයි.

(පිට 137)

ගැමියා ගේ ගරුත්වයට පාත්‍ර වූයේ ජව බලය සපයන ගෙරියා පමණක් නොවේ. කුඹුරේ කරල් කැපීමට පෙර දෑකැත්තට වැඳීම ලඳුන්ගේත්, ගොයම් කොළය ගොඩ ගැනීමේදී මුල්ම කරල් මිටියට, ගොයම් පයින් පාගා අස්වැන්න වෙන් කිරීමේදී මුල්ම ගොයම් මිටියට හා පාවර මැනීමේදී කුරුණියටත් වැඳීම ගොවියන් ගේත් පිළිවෙතයි. සිය උදර පෝෂණය කරන 'බුද්ධ භෝග' වලට නමස්කාර කිරීම පරිසර භක්තිය පළ කිරීමක් නොවේද, එමතුද නොවේ.හාල් ගරා ලිප තැබීමට පර දැත් එක් කොට නමස්කාර කිරීම ගෙවිළියගේ පිළිවෙතයි.

මෙවන් වත් පිළිවෙත් හණමිටි යුගයේ බහු බූත ලෙස නූතන සංකරයන් සලකනු නිසැකය. එහෙත් එමගින් හෙළිවන යථාර්ථය කුමක්ද? සිය දිවි පෙවෙත රැක ගනු පිණිස විවිධ ජීවී අජීවී පාරිසරික සම්පත් වටහා ගත් සිංහලයා, ඒ අනිවාර් සම්පත්වල මෙහෙවර අගයමින් සිය කෘතවේදීත්වය පරිසර වේදිත්වයකට රූපාන්තරණය කිරීමට තරම් පරිසර හිතකාමී වූ බව නොවේද? පාරම්පරික සිංහල වත් පිළිවෙත් විද්‍යාත්මකව විමසී මෙන් නූතනයන්ට උගත හැකි පරිසර හිතකාමී පාඩම් අපමණ බව නොවේද? පරණ වූ හැමෙකක් ම හණමිටි නොවන බව අප වටහා ගත යුත්තේ එහෙයිනි.

